**ශුද්ධ පවිත්‍ර කිරීම හා සනීපාරක්ෂක සේවය ලබා ගැනීම සඳහා ලංසු සඳහා ආරාධනාවයි - 2027**

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මහනුවර**

# KDS/2/6/3/1

**01. ප්‍රසම්පාදනයේ අරමුණ**

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා අවට පරිශ්‍රය, ශ්‍රවණාගාර ගොඩනැගිල්ල හා අවට පරිශ්‍රය, කටුගස්තොට රාජ්‍ය සේවා පුහුණු ආයතනය, දිසාපති නිල නිවස සහ මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 ක, 2027 වර්ෂයේ ශුද්ධ පවිත්‍ර කිරීම හා සනීපාරක්ෂක සේවය ලබා ගැනීම සඳහා ඒ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන අසාධු ලේඛණගත නොවූ සුදුසුකම්ලත් සේවා සැපයුම්කරුවන්ගෙන් ලංසු ආරාධනා කරනු ලැබේ.

**02. සේවා ආවරණය**

මෙම සේවා කොන්ත්‍රාත්තුව යටතේ පහත සඳහන් සේවා ස්ථාන ආවරණය වේ.

දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල හා ඒ අවට පරිශ්‍රය, ශ්‍රවණාගාරය සහ ඒ අවට පරිශ්‍රය, කටුගස්තොට පිහිටි රාජ්‍ය සේවා පුහුණු ආයතනය, දිසාපති නිල නිවස සහ කුණ්ඩසාලේ, පාතදුම්බර, පන්විල, යටිනුවර, උඩුනුවර, උඩපළාත, දොළුව, පාතහේවාහැට, දෙල්තොට, මැදදුම්බර, උඩදුම්බර, මිණිපේ, අකුරණ, පූජාපිටිය, හාරිස්පත්තුව, ගලගෙදර, හතරලියද්ද, ගඟඉහළකෝරළේ සහ පස්බාගේකෝරළේ යන ප්‍රාදේශිය ලේකම් කාර්යාල 19

**03. කොන්ත්‍රාත් කාලය**

2027 ජනවාරි 01 වැනිදා සිට 2027 දෙසැම්බර් 31 දක්වා මාස 12 ක කාලය

**04. ලංසු වලංගු කාලය**

ලංසු භාර ගැනීමේ අවසන් දිනයේ (2026.11.04) සිට අවම වශයෙන් දින 91 (2027.02.02 වන තෙක්) තෙක් වලංගු වන පරිදි ලංසු ඉදිරිපත් කළ යුතුය.

**05. ලංසු ඇපකරය**

ලංසුකරුවන් විසින් ලංසු ලේඛනයේ සඳහන් ආකෘතියට අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවකින් **දිස්ත්‍රික් ලේකම්, මහනුවර** නමින් ලබාගත් රු. 280,000.00 ක වටිනාකමෙන් සහ ලංසු විවෘත කරන දින සිට දින 119 (2027.03.02) දක්වා වලංගු වන පරිදි, කොන්දේසි විරහිත ලංසු සුරක්ෂණ සහතිකයක් හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සරප් වෙත මුදලින් කරන තැන්පත් කිරීමක් සඳහා වූ ලදුපත ලංසු සමඟ ඉදිරිපත් කළ යුතුය.

**06. ලංසු ලේඛන නිකුත් කිරීම**

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සරප් වෙත ආපසු නොගෙවන රු. 5,500.00 ක මුදලක් ගෙවා ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් 2026.10.16 දින සිට 2026.11.03 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලය තුළ මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයෙන් ලංසු ලියවිලි ලබා ගත හැකිය.

**07. පූර්ව ලංසු රැස්වීම**

පූර්ව ලංසු රැස්වීම 2026.10.26 දින පෙ.ව. 10.00 ට මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ C ශාලාවේදී පැවැත්වේ. මිල ගණන් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන ලංසුකරුවන්ට මෙම රැස්වීමට සහභාගි වීමෙන් කාර්යයේ ස්වභාවය, සේවාවන් ලබා දිය යුතු ස්ථාන, කොන්දේසි සහ අනෙකුත් අවශ්‍යතා පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබාගත හැකිය.

**08. ලංසු ලේඛන ඉදිරිපත් කිරීම හා භාරගැනීම**

නිසි පරිදි සම්පූර්ණ කරන ලංසුපත් පිටපත් දෙකකින් සකස් කර මුල් පිටපත හා අනු පිටපත වෙන් වෙන්ව නම් කර මුද්‍රා තබා එක කවරයක බහා 2026.11.04 දින ප.ව. 2.30 ට හෝ ඊට පෙර ලැබෙන සේ මහනුවර දිස්ත්‍රික් ලේකම් සහ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කළ හැකි ය. ලංසුපත් ඉදිරිපත් කරන කවරයේ ඉහළ වම් කෙළවර **"ශුද්ධ පවිත්‍රතා සේවා ලබා ගැනීම - 2027"** යනුවෙන් සඳහන් කළ යුතුය.

**09. ලංසු විවෘත කිරීම**

ලංසුපත් භාර ගැනීම 2026.11.04 දින ප.ව. 2.30 ට අවසන් වන අතර එදිනම ප.ව. 2.35 ට මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරි නිල කාමරයේදී ලංසුපත් විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ නියෝජිතයකුට පැමිණ සහභාගී විය හැකිය.

**10. ලංසු ඇගයීම් කිරීම**

2024 නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් විධිවිධාන හා ලංසු කොන්දේසි අනුව ආයතනික පලපුරුද්ද, මානව සම්පත් හා සේවකයින් යෙදවීමේ සැලැස්ම, පිරිසිදු කිරීමේ ක්‍රමවේදය හා භාවිතා කරන ද්‍රව්‍ය හා උපකරණ, තත්ත්ව පාලනය හා අධීක්ෂණය, අපද්‍රව්‍ය කළමනාකරණය, සේවා ස්ථාන වල සෞඛ්‍ය හා ආරක්ෂාව සහ ආදේශක සේවා හා හදිසි සේවා සැලැස්ම යනාදි කරුණු අනුව තාක්ෂණික වශයෙන් ලංසු ඇගයීමේ කමිටුව විසින් ලංසුපත් ඇගයීම සිදුකරනු ලැබේ.

**11.** මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර අවශ්‍ය වන්නේ නම් මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරීගේ දුරකථන අංක 081 2233604 ඇමතීමෙන් ලබාගත හැකිය.

**12.** ලද ලංසු අතරින් යෝග්‍ය ලංසුවක් පිළිගැනීම හෝ අසම්පූර්ණව ඉදිරිපත් කර ඇති ලංසුපත් ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර, ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය වේ.

සභාපති, ප්‍රසම්පාදන කමිටුව,
දිස්ත්‍රික් ලේකම් / දිසාපති, මහනුවර.